# DOUBLE ENTRY SYSTEM (Part-I)

***S. Madushanka***

***B.Sc (Mgt) Accounting (Special) (U.G)***

***University of of Sri Jayewardenepura***

# ගිණුම

සෑම ව්‍යාපාරික ගනුදෙනුවකම හා සිදුවීමක ද්විත්ව ස්වරූපයක් පවතී.

ගිණුම්කරණ ඒකකයක ඇති වන මූල්‍යමය ගනුදෙනු වාර්තා කරන සම්මත ආකෘතිය "ගිණුම" වේ.

එහි දී ව්‍යාපාරික ගනුදෙනු හා සිදුවීම්වල ද්විත්ව ස්වරූපය නිශ්චිත දිනක සිට තවත් නිශ්චිත දිනයක් දක්වා අනුපිළිවෙලින් වාර්තා කරනු ලැබේ.

# ද්විත්ව සටහන් ක්‍රමය

ගනුදෙනුවල ද්විත්ව මූල්‍ය ප්‍රථිඵලය ව්‍යාපාරය කෙරෙහි දෙයාකාරයකට බලපාන අතර, එකී බලපෑම එකවර සටහන් කරන ක්‍රමය "ද්විත්ව සටහන් ක්‍රමය" නම් වේ.

ගනුදෙනුවක ද්විත්ව මූල්‍ය ප්‍රථිඵලය දවිත්ව සටහන් මූලධර්මය මත පදනම වන අතර, මෙය ක්‍රි.ව වර්ෂ 1494 දී ඉතාලි ජාතික ලූකා පැසියෝලි (Luca Pacioli) පියතුමා විසින් මුල් වරට ඉදිරිපත් කරනු ලැබීය.

ClassWork.LK

# ද්විත්ව සටහන් මූලධර්ම

සෑම ගනුදෙනුවක ම ද්විත්ව ස්වරූපය ගිණුම්වලට පිටපත් කළ යුතු ආකාරය ද්විත්ව සටහන් මූලධර්මයෙන් කියවෙන අතර, එම ද්විත්ව ප්‍රථිඵලය හර හා බැර වශයෙන් එකවර සටහන් කිරීමට අනුගමනය කරන රීතීන් සමූහය ද්විත්ව සටහන් මූලධර්ම වේ

සෑම ගනුදෙනුවක් නිසාම වත්කම්, වගකීම් හා හිමිකම වැඩිවීම හෝ අඩුවීම ගිණුම්කරණයේ දී හර හා බැර වශයෙන් සටහන් තබයි. හර යන්න භාවිත කළ යුත්තේ වැඩිවීමට ද අඩුවීමට ද යන්න ද්විත්ව සටහන් රීතීන්වලින් මග පෙන්වයි.

ClassWork.LK

# ලෙජර් ගිණුමක ආකෘතිය

සම්ප්‍රදායික ලෙජර් ගිණුමක ආකෘතිය ඉංග්‍රීසි අකුරක "T" හැඩය ගන්නා අතර භාවිතයේ දී ඒ සඳහා පහත ස්වරූපයක් උපයෝගී කර ගනියි.

## ගිණුමක ආකෘතීන්

(i)

හර                                                  බැර

45

(ii)

හර ............................ ගිණුම බැර

| දිනය | විස්තරය | සඟල | වටිනාකම | දිනය | විස්තරය | සඟල | වටිනාකම |
|---|---|---|---|---|---|---|---|
| | | පිටුව | (රු.) | | | පිටුව | (රු.) |
| | | | | | | | |

(iii) ............................ ගිණුම

| දිනය | විස්තරය | සඟල | හර | බැර | ශේෂය |
|---|---|---|---|---|---|
| | | පිටුව | (රු.) | (රු.) | (රු.) |
| | | | | | |

ClassWork.LK

# ලෙජරය

ගිණුම් සියල්ල එකතු වන ස්ථානය **ලෙජරය** නම් වේ. එය පොතක්, ලිපි ගොනුවක්, විද්‍යුත් පත්‍රිකාවක් හෝ කාඩ් පතක් විය හැකි ය.

උදා : පරිගණකගත ආයතනයක ගනුදෙනු වාර්තා, චුම්බක පටියක (Magnetic tape) හෝ චුම්භක තැටියක (Magnetic Disc) සටහන් කිරීම.

# ලෙජර් ගිණුම් වර්ග

ව්‍යාපාරික ගනුදෙනුවලින් මතුවන ලෙජර් ගිණුම් වර්ග **5** කි. එනම් වත්කම්, වියදම්, වගකීම්, ආදායම් හා හිමිකම් ගිණුම් වේ.

ඒ ඒ ගිණුම්වල වටිනාගම් අඩුවීම හා වැඩිවීම පහත අයුරි සාරාංශ කළ හැකිය.

**වත්කම් හා වියදම් ගිණුම්**

| හර | බැර |
|---|---|
| වැඩිවීම | අඩුවීම |
| + | - |

සාමාන්‍ය ශේෂය

**ප්‍රාග්ධනය ආදායම් හා වගකීම් ගිණුම්**

| හර | බැර |
|---|---|
| අඩුවීම | වැඩිවීම |
| - | + |

සාමාන්‍ය ශේෂය

ClassWork.LK

# මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග

ගනුදෙනු හා සිද්ධීන්වල බලපෑම වාර්තා කරන වත්කම්, වගකීම්, ආදායම්, වියදම් හා හිමිකම් ගිණුම් මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංග ලෙස හඳුන්වයි.

ClassWork.LK

# අභ්‍යාස

(1).

| ගනුදෙනුව | ද්විත්ව සටහන් රීතිය | ද්විත්ව සටහන (රු.) |
|---|---|---|
| 1. ව්‍යාපාරය ආරම්භ කිරීමට අයිතිකරු රු. 200 000 ක් යෙදවීම | වත්කම් වැඩිවීම - හර<br>හිමිකම් වැඩිවීම - බැර | මුදල් ගිණුම - හර 200 000<br>ප්‍රාග්ධන ගිණුම - බැර 200 000 |
| 2. රු. 25 000 ක ලී බඩු මිලට ගැනීම. | ................................... | ................................... |
| 3. රු. 60 000 ක භාණ්ඩ අත්පිට මුදලට ගැනීම. | ................................... | ................................... |
| 4. අත්පිට විකුණුම් රු. 100 000 | ................................... | ................................... |
| 5. දුරකතන බිල් ගෙව්වා රු. 6 000 | ................................... | ................................... |
| 6. රු. 30 000 ක භාණ්ඩ ණයට ගැනීම | ................................... | ................................... |
| 7. රු. 40 000 ක භාණ්ඩ ණයට විකිණීම | ................................... | ................................... |
| 8. ණය හිමියන්ට මුදල් ගෙව්වා රු. 20 000 | ................................... | ................................... |
| 9. ණය ගැතියන්ගෙන් මුදල් ලැබුණා රු. 35 000 | ................................... | ................................... |
| 10. ගෙවල් කුලී ආදායම් ලැබුණා රු. 72 000 | ................................... | ................................... |
| 11. බැංකු ණයක් ගත්තා රු. 100 000 | ................................... | ................................... |
| 12. අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට රු. 5000 ක් ව්‍යාපාරයෙන් ගත්තා. | ................................... | ................................... |

ClassWork.LK

අවශ්‍යවන්නේ,

(i). අදාල හිස්තැන් සහිත තීරු සම්පූර්ණ කරන්න.

(ii). ඉහත ද්විත්ව සටහන් තීරුවේ ඇති දෑ ලෙජරයට පිටපත් කරන්න.

(iii). ලෙජර් ගිණුම තුලනය කරන්න.

(iv). එම ගිණුම් මූල්‍ය ප්‍රකාශන මූලිකාංග යටතේ වර්ග කර දක්වන්න.

**(02).** පහත දැක්වෙන්නේ ව්‍යාපාර ආයතනයක සිදූ වූ ගනුදෙනුවල ද්විත්ව සටහන් කිහිපයකි. ඊට සම්බන්ධ ගනුදෙනුව නම් කරන්න.

ClassWork.LK

| ද්විත්ව සටහන | | (රු.) | (රු.) | ගනුදෙනුව |
|---|---|---|---|---|
| 1. මුදල් ගිණුම<br>ප්‍රාග්ධන ගිණුම | හර<br>බැර | 300 000 | <br>300 000 | ...................... |
| 2. මෝටර් රථ ගිණුම<br>ප්‍රාග්ධන ගිණුම | හර<br>බැර | 150 000 | <br>150 000 | ...................... |
| 3. බැංකු ණය ගිණුම<br>මුදල් ගිණුම | හර<br>බැර | 20 000 | <br>20 000 | ...................... |
| 4. ගැනුම් ගිණුම<br>මුදල් ගිණුම<br>ණය හිමි පාලන ගිණුම | හර<br>බැර<br>බැර | 50 000 | <br>30 000<br>20 000 | ...................... |
| 5. විදුලිය ගිණුම<br>මුදල් ගිණුම | හර<br>බැර | 8 000 | <br>8 000 | ...................... |
| 6. ණයගැති පාලන ගිණුම<br>විකුණුම් ගිණුම | හර<br>බැර | 20 000 | <br>20 000 | ...................... |
| 7. ණය හිමි පාලන ගිණුම<br>මුදල් ගිණුම | හර<br>බැර | 20 000 | <br>20 000 | ...................... |
| 8. මුදල් ගිණුම<br>දුන් වට්ටම් ගිණුම<br>ණයගැති පාලන ගිණුම | හර<br>හර<br>බැර | 8 000<br>2 000 | <br><br>10 000 | ...................... |
| 9. ගැණීලි ගිණුම<br>ගැණුම් ගිණුම | හර<br>බැර | 6 000 | <br>6 000 | ...................... |
| 10. විදුලිය වියදම් ගිණුම<br>ගෙවිය යුතු විදුලිය වියදම් ගිණුම | හර<br>බැර | 1 500 | <br>1 500 | ...................... |

(03) ද්විත්ව සටහන් රීතිය **නිවැරදිව දක්වා නැති** වගන්තිය දක්වන්න.

(i) වත්කම් හා වියදම් වැඩිවීම හර

(ii) වත්කම් හිමිකම් හා ආදායම් වැඩිවීම බැර

(iii) වත්කම් හා වියදම් අඩුවීම හර

(iv) වගකීම් හිමිකම් හා ආදායම් අඩුවීම හර

"(v) වත්කම් හා වියදම් අඩුවීම බැර

ClassWork.LK

(04) ගනුදෙනුවට අදාළ ද්විත්ව සටහන **නිවැරදිව දක්වා ඇති** වගන්තිය දක්වන්න.

(i) අත්පිට මුදලට බඩු ගත්තා. රු. **20 000** යි.

ගැනුම් ගිණුම හර - මුදල් ගිණුම බැර

(ii) ණයට බඩු ගත්තා. රු. **30 000** යි.

තොග ගිණුම හර. ණය ගැති ගිණුම බැර

(iii) ණයට බඩු විකිණුවා. රු. **50 000** යි.

විකුණුම් ගිණුම හර - තොග ගිණුම බැර

(iv) ණයට බඩු විකුණුවා. රු. 40 000 යි.

විකුණුම් ගිණුම හර ණයගැති ගිණුම බැර

(v) දුරකථන බිල ලැබුණා. රු. **2 000** යි.

දූරකථන වියදම් ගිණුම හර මුදල් ගිණුම බැර

(05) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද/අසත්‍යය ද යන්න දක්වන්න.

1. ගිණුම්කරණයේ පියා ලූකා පැසියෝලි සාමිවරයා ය ( )

**2.** ගනුදෙනු හා සිද්ධීන්වල ද්විත්ව බලපෑම ගිණුම්වල වාර්තා කරන්නේ ද්විත්ව සටහන් රීතිය පදනම් කර ගෙනයි. ( )

**3.** හිමිකම් පිළිබඳ ද්විත්ව සටහන් රීතිය හා වගකීම් පිළිබඳ ද්විත්ව සටහන් රීතිය එකිනෙකට වෙනස් වේ ( )

4. භාණ්ඩ ගැනිලි හිමිකම අඩු කරයි ( )

**5.** ගිණුම් කාලච්ඡේදයක් තුළ දී උපයන ශුද්ධ ලාභය අයිතිකරුගේ හිමිකම වෙනස්වීමට බලනොපායි ( )

ClassWork.LK

(06) පහත සඳහන් ගණුදෙනුවල ද්විත්ව බලපෑම හා ද්විත්ව සටහන දක්වන්න.

ලෝචන ව්‍යාපාරයේ 2021 ජනවාරි මාසය

| ගනුදෙනුව | ද්විත්ව බලපෑම | ද්විත්ව සටහන |
|---|---|---|
| උදා : ලෝචන ව්‍යාපාරයක් ආරම්භ කිරීමට මුදලින් රු. 500 000 ක් යෙදීම. | වත්කම් වැඩිවීම - හර<br>හිමිකම් වැඩිවීම - බැර | මුදල් ගිණුම හර 500 000<br>ප්‍රාග්ධන ගිණුම බැර 500 000 |
| 1. අමන්දා ව්‍යාපාරයෙන් රු. 80 000 ක බඩු තොග ණයට ගැනීම. | | |
| 2. ව්‍යාපාරයේ ප්‍රයෝජනය පිණිස රු. 150 000 ක කාර්යාල උපකරණ මිලට ගැනීම | | |
| 3. බැංකුවෙන් රු. 200 000 ක් ණය ගැනීම. | | |
| 4. අත්පිට මුදලට බඩු විකුණුවා. රු. 100 000 යි. | | |
| 5. සේවක වේතන ගෙව්වා. රු. 10 000 යි. | | |

අවශ්‍යවන්නේ,

ඉහත ගනුදෙනු ලෙජර් ගිණුම්වල සටහන් කරන්න.

ClassWork.LK



පළමු මස
නොමිලේ...
2022
ADVANCED
LEVEL
ACCOUNTING
MASS CLASS
ONLINE CLASS
ZOOM තාක්ෂණය ඔස්සේ...
මාර්තු
26
ලියාපදිංචි වීමට :-
076 36 55 550
සෙනසුරාදා
උදෑසන 8.30
සුපුන් මදුශංක
B.sc.(Mgt) Accounting (Special) (U.G.)
University of Sri Jayewardenepura